**ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව**

---

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 280 - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 22 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී . විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 16 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ .

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී . මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී .

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

**(අ) වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස් කළ ආදායම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.2 හා 7.10 ඡේද ප්‍රකාරව වෙනත් ආදායම් ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් රැස්කළ ආදායම අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ගැලපිය යුතුව තිබුණි. ඊට පටහැනිව රු.3,610,574 ක ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | එකඟ වෙමි. ආදායම් නොවන ලැබීම් නිසා රු. 3,610,574 ක් වූ ආදායම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් යටතේ ගිණුම්ගත කර ඇත. ඉදිරියේ දී මාර්ගෝපදේශයට අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව පිළියෙල කළ යුතු වීම. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.6 ඡේදය ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශය (ACA – C) මුදල් හා හරස් සටහන් යන දෙඅංශයම සැලකිල්ලට ගෙන ඍජු ක්‍රමය භාවිතා කරමින් පිළියෙල කළ යුතුව තිබුණි. දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ ඒකාබද්ධ විස්තරාත්මක ශේෂ පිරික්සුම අනුව අත්තිකාරම් ගෙවීම් රු.8,007,519 ක්ද අත්තිකාරම් ලැබීම් රු.7,063,022 ක් වී තිබුණි. | එකඟ නොවෙමි. චක්‍රලේඛ හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව නිවැරදි ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර අදාළ අත්තිකාරම් ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ඇතුළත් කර ඇත. තවද ඔබ විසින් දක්වා ඇති 3,870,140 ක මුදල ද්‍රවශීල ලෙස නොගැනෙන බැවින් හරස් සටහන් මගින් ගිණුම්ගත කර ශේෂය ශේෂ පිරික්සුමෙහි දක්වා ඇත. තවද විගණන විමසුමෙහි අත්තිකාරම් ලැබීම් ලෙස දක්වා ඇති රු.7,063,022 ට අදාළව සටහනක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හෝ ශේෂ පිරික්සුමෙහි සඳහන් නොවේ. | මූල්‍ය ප්‍රකාශන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව පිළියෙල කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | නමුත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම ගෙවීම් හා ලැබීම් පිළිවෙලින් රු.4,137,380ක් හා රු.3,192,882 ක් වශයෙන් දක්වා තිබුණි. ඒ අනුව අත්තිකාරම් ලැබීම් හා ගෙවීම්වල වටිනාකම රු.3,870,140 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ii) | 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහයන්ගේ මුදල් වැය කිරීම් ලෙස භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.17,933,943 ක වටිනාකමක් දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා එම වටිනාකම රු.17,785,943 ක් වීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.148,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ නොවෙමි. හැකියා වර්ධන පුහුණුව මෙහෙයුම් ක්‍රියාකාරකමක් ලෙස නොසලකන අතර එය දිගු කාලීන ආයෝජනයක් ලෙස සලකන බැවින් “භෞතික වත්කම් ඉදිකිරීම් හා මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්” යටතේ ගිණුම්ගත කර තිබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වර්ෂයේ භෞතික වත්කම් ඉදිකිරීම හෝ අත්පත් කර ගැනීම හා මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය හා මූල්‍ය නොවන වත්කම් ප්‍රමාණයට සමාන විය යුතු වීම. |

## (ඇ) නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශයේ 8.3 ඡේදය | දෙපාර්තමේන්තුවේ තැන්පතු පිළිබඳ සැසඳුම් ප්‍රකාශය 2022 මැයි 31 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | එකඟ වෙමි. ඒ අනුව අදාළ චක්‍රලේඛය පරිදි ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**
------------------------

**2.1** **අග්‍රිම කළමනාකරණය**
-------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් 2021 නොවැම්බර් මාසය සඳහා අග්‍රිම අවශ්‍යතාවය රු.7,568,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබුණි. එම මාසයේදී දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කළ අග්‍රිමය ඉක්මවා, රු.14,050,000 ක අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණි. | එකඟ වෙමි. කෙසේ වුව ද මෙය මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැර වූ මූල්‍ය ක්‍රියාකාරකමකි. වර්ෂය ආරම්භයේදී අප දෙපාර්තමේන්තුවට පමණක් රු.7,568,000 ක් ඉල්ලුම් කළ අතර අගෝස්තු මාසයේදී සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යාංශයේ අයවැය ප්‍රතිපාදන අපගේ දෙපාර්තමේන්තු ශීර්ෂය හරහා ලැබුණු බැවින් අදාළ මාසයේ රු.14,050,000 ක් අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇත. මූල්‍ය ප්‍රකාශනවල (ඒසීඒ -2) ආකෘති පත්‍රයේ සටහනක් මගින් පෙන්වා දී ඇත. | නිවැරදි හා තාත්ත්වික ලෙස අග්‍රිම ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

**2.2** **වියදම් කළමනාකරණය**
--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **ප්‍රතිපාදන නිෂ්ඵල වීම**<br>වැය විෂයක් සඳහා රු.2,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී ඉන් කිසිදු උපයෝජනයක් කර නොතිබුණි. ඒ අනුව සලසා තිබුණ සම්පූර්ණ ප්‍රතිපාදනයම මුළුමනින්ම ඉතිරි කර තිබුණි. | එකඟ වෙමි. 2021 වර්ෂයෙහි රටෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපෘති ඇගයීම් කටයුතු සඳහා අපේක්ෂා කළ පරිදි ක්ෂේත්‍ර ඇගයීම් කටයුතු ක්‍රියාත්මක නොවුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

(ආ) **අධි ප්‍රතිපාදන සලසා ගැනීම**

| | | |
|---|---|---|
| මූලධන වැය විෂයයන් 03 ක් හා පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සඳහා එකතුව රු.212,000,000 ක අධි ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.10,683,314 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව එකතුව රු.201,316,686 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි. එම ඉතිරිය එක් එක් වැය විෂයයන් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 97 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | එකඟ වෙමි. 2021 වර්ෂයෙහි රටෙහි පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් අත්‍යවශ්‍ය කාර්ය මණ්ඩලය පමණක් සේවයට කැඳවීමට සිදුවිය. මෙම අනපේක්ෂිත තත්ත්වය හේතුවෙන් මූලධන හා පුනරාවර්තන ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 97 ක් දක්වා ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව නිවැරදිව හා තාත්ත්විකව වාර්ෂික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. |

**2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වැය විෂයයන් 04 කට අදාළ බැඳීම් හා බැරකම් වශයෙන් එකතුව රු.845,000 ක් වී තිබුණත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.12,786 ක් අඩුවෙන් රු.831,714 ක් ලෙස දක්වා තිබුණි. | එකඟ වෙමි. කෙසේ වුවද, අදාළ බැඳීම් හා බැරකම් 2021 වර්ෂයේ දෙසැම්බර් මාසයේ පරිගණකගත ඒකාබද්ධ රජයේ ගිණුම්කරණ පද්ධතියට (CIGAS) නියමිත කාල සීමාව තුළ ඇතුළත් කළද, එය තාක්‍ෂණික දෝෂයක් මත යාවත්කාලීන වී නොමැත. දත්ත පද්ධතිය තුළ යාවත්කාලීන නොවීම හේතුවෙන් මේ දක්වා එහි 2020 වර්ෂයේ තොරතුරු පෙන්නුම් කරයි. මෙය මෙම දෙපාර්තමේන්තුවේ පාලනයෙන් බැහැරවූ කටයුත්තකි. කෙසේ වෙතත් 2021 මූල්‍ය ප්‍රකාශනයෙහි අදාළ බැඳීම් හා බැරකම් නිවැරදි ලෙස සටහන් කර ඇත. | බැරකම් හා බැඳීම් නිසිපරිදි මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සටහන් කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විගණනය වෙත මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු බැරකම් ප්‍රකාශයෙහි 2021 අගෝස්තු 16 දින ස්ථාපිත කළ සංවර්ධන හා සම්බන්ධීකරණ අමාත්‍යාංශයේ බැරකම් ලෙස රු.304,172 ක් දක්වා තිබුණි. 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ සටහන් අංක (iii) හා (iv) හි සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල (SA 92) බැඳීම් හා බැරකම් ලෙස දක්වා නොතිබුණි. | -එම- | -එම- |
| (ඇ) | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.3 ඡේදය ප්‍රකාර සටහන් අංක (iii) යටතේ ඇති බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සියළුම බැඳීම් හෙළිදරව් කළ යුතු වුවද, එකතුව රු.120,000 ක් වූ බැඳීම් හෙළිදරව් කර නොතිබුණි. | - එම - | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය ප්‍රකාරව බැරකම් හා බැඳීම් මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව සඳහන් කළ යුතු වීම. |

**2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 අගෝස්තු මාසයේ සිට දෙපාර්තමේන්තුවෙන් නිලධාරිනියක් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ තනතුරක් ලබා පුහුණුව සඳහා අනුයුක්ත කර තිබුණි. එම නිලධාරිනියගෙන් ආපදා ණය හා උත්සව අත්තිකාරම් වශයෙන් එකතුව රු.232,858 ක් අයවිය යුතුව පැවතුණි. 2022 මාර්තු මාසය අවසන් වන විටත් දෙපාර්තමේන්තුව විසින් එම නිලධාරියාගේ ණය ශේෂය අයකර ගෙන නොතිබුණි. | එකඟ වෙමි. එම නිලධාරිනිය අනුරාධපුර කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ස්ථිර පත්වීමක් ලබා ඇත. එම දෙපාර්තමේන්තුවේ සිටින ආපදා ණය හා උත්සව අත්තිකාරම් ණය ශේෂයන් නිරවුල් කරන බව අප වෙත දුරකථනයෙන් දැනුම් දී ඇත. මේ සම්බන්ධව සිහිකැඳවීම් ලිපිද යවා ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර ණය ශේෂ අයකර ගෙන ස්ථාන මාරු වීම් සිදු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සාමාජික ණය ලේඛනයට (CC 10) අනුව එක් නිලධාරියෙකුගෙන් අයවියුතු රු.7,562 ක ආපදා ණය ශේෂය අත්තිකාරම් ගිණුමෙහි දක්වා නොතිබුණි. | එකඟ වෙමි. රු.7,562 ක ද ආපදා ණය ශේෂයක් සාමාජික ණය ලේඛනයේ සඳහන් වී ඇත්තේ, ලේඛනය ලිවීමේදි සිදුවූ අත්වැරදීමක් නිසාවෙනි. දැනටමත් එය නිවැරදි කර ඇත. | ලේඛන නිවැරදිව හා යාවත්කාලීන කර පවත්වා ගත යුතු වීම. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 3.7 වගන්තිය අනුව නිලධාරීන්ට ණයදීමේදී ණය මුදලට අදාළ වාරිකය හා පොලිය ණය මුදල දුන් මාසයට පසු මාසයේ සිට අයකළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 07 දෙනෙකුගේ එකතුව රු.710,927 ණය ශේෂයට අදාළ ණය වාරික අය කර ගැනීමේදී ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රටෙහි පැවති කොරෝනා වසංගත තත්ත්වය නිසා ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය නිවසේ සිට රාජකාරී කිරීම හේතුවෙන් අදාළ ලේඛන පවත්වා ගැනීමේදී ගැටළු ඇති විය. ඒ නිසා ණය වාරික ක්‍රමානුකූලව අයකර ගැනීමට බාධාවක් වූ අතර, එම තත්ත්වයන් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්ති ප්‍රකාරව සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.139,921 ක් වූ ණය ශේෂය වර්ෂ 6 ක කාලයක සිට පැවත එමින් තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ණය ශේෂ අයකර ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි අදාළ නිලධාරියා විසින් 2021.07.11 දින සමථ මණ්ඩලයෙන් ඉල්ලීමක් සිදු කර ඇති බවත්, එය සලකා බැලීමට මෙම නිලධාරියා නැවත රාජ්‍ය සේවයේ පිහිටුවීම ප්‍රථමයෙන් තීරණය කළ යුතු බවත්, ඒ සඳහා ඔහුගේ පෞද්ගලික ලිපිගොනුව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යැවීමට නීතිපතිවරයාගේ උපදෙස් ලබා ගැනීමට ලිපියක් යැවීම. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඉ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ACA – 5 ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම්වලට අදාළ උපරිම වියදම් සීමාව, අවම ලැබීම් සීමාව හා හර ශේෂයන්ගේ උපරිම සීමාව දක්වා නොතිබුණි. | එකඟ වෙමි. ඒ අනුව අදාළ චක්‍රලේඛය පරිදි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරකම් 03 ක ප්‍රගතිය අත්පත් කරගෙන නොතිබුණි. | Covid – 19 වසංගත තත්ත්වය නිසා එක් ක්‍රියාකාරකමක් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. අනෙක් ක්‍රියාකාරකම් 2 හි ඉටු කිරීමේ අවශ්‍යතාවයක් නොතිබුණු බැවින් එය ඉටු කර නොමැත. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් ක්‍රියාකාරකම් 03 ක අරමුණු කරා ළඟා වීම සියයට 60 කට වඩා අඩු මට්ටමක පැවතුණි. | ක්‍රියාකාරකම් 02 ක ප්‍රගතිය Covid – 19 වසංගත තත්ත්වය නිසා සියයට 60 කට වඩා අඩු මට්ටමක පැවතුණි.<br><br>ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක NPD/RDD/DCB/2021/General දරන 2021.07.05 දිනැති ලිපිය අනුව ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන් ලෙස විමධ්‍යගත අයවැය වැඩසටහනෙහි ප්‍රගති සමාලෝචන සිදු කර වාර්තා 12 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණු අතර, ඒ සඳහා වර්ෂයේ ඉතිරිව තිබූ කාලය අනුව ප්‍රගති වාර්තා 3 ක් පමණක් සකස් කරන ලදී. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රියාකාරකම් වෙනුවෙන් රු. මිලියන 298.5 ප්‍රතිපාදන සලසා ගෙන තිබුණ ද, ප්‍රගති වාර්තාවට අනුව වියදම රු.මිලියන 81.98 ක් වී තිබුණු අතර ඒ අනුව ඉතිරිය රු.මිලියන 216.5 ක් වී තිබුණි. | 2021 වර්ෂයේ රටේ පැවති වසංගත තත්ත්වය හමුවේ අත්‍යාවශ්‍ය වියදම් පමණක් සිදුකිරීම හා දෙපාර්තමේන්තුවේ යෝජිත පරිගණක මෘදුකාංගය සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඇති වූ ප්‍රමාදය නිසා ප්‍රතිපාදන ඉතිරිවීම. | ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 3.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ප්‍රසම්පාදන සැලැස්මෙහි පරිගණක මිලදී ගැනීම සඳහා රු.මිලියන 10 ක්ද, දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය සඳහා රු.මිලියන 42 ක් සහ සේවා සඳහා රු.මිලියන 150 ක්ද වශයෙන් එකතුව රු.මිලියන 202 ක් වෙබ් අඩවිය පාදක කරගත් ව්‍යාපෘති අධීක්ෂණ පද්ධතිය ප්‍රසම්පාදනය සඳහා ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ප්‍රසම්පාදන සැලැස්ම අනුව 2021 ජනවාරි මාසයේ හතරවෙනි සතියෙන් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර 2021 ඔක්තෝබර් මාසයේ පළමුවෙනි සතියෙන් අවසන් කළ යුතුව තිබුණි. නමුත් 2021 දෙසැම්බර් මාසයේ හතරවෙනි සතියේදී පරිගණක මිලදී ගැනීම සිදුකර තිබුණි. ඒ අනුව මාස 2 ක් ප්‍රමාද වී තිබුණු අතර දෘඩාංග හා මෘදුකාංග පද්ධතිය හා සේවාවන් ඉහත කාල රාමුව තුළ සිදුකිරීමට අපොහොසත් වී තිබුණු අතර එය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මට අනුව මෘදුකාංග පද්ධතිය සකස් කිරීම හා පරිගණක මිලදී ගැනීමට රු.මිලියන 202 ක ප්‍රතිපාදන සලසා තිබූ අතර, මෘදුකාංග පද්ධතිය සකස් කිරීම සඳහා පිරිවිතර සකස් කිරීම, සමාන මෘදුකාංග පරිශීලනය සඳහා කල්ගතවීම මෙන්ම දීර්ඝ ප්‍රසම්පාදන ක්‍රියාවලිය හේතුවෙන් 2021 වර්ෂය අවසන් වීමට පෙර මෘදුකාංගය සකස් කිරීමේ ටෙන්ඩරය පිරිනැමීමට නොහැකි වීම හේතුවෙන් අදාළ ප්‍රතිපාදන ඉතිරිවීමක් සිදුවිය. එමෙන්ම ප්‍රසම්පාදන සැලැස්මට අනුව 2021 ඔක්තෝබර් පළමු සතියේ පරිගණක මිලදී ගෙන අවසන් කළ යුතු වුවද, ගෝලීයව පැවති කොවිඩ් – 19 වසංගතය හමුවේ පරිගණක නිෂ්පාදනය ප්‍රමාද වීම හා හිඟ බව, ණයවර ලිපි විවෘත කිරීමේ ප්‍රමාදයන්, ජාත්‍යන්තර භාණ්ඩ ප්‍රවාහනයේ සිදු වූ ප්‍රමාදයන් හේතුවෙන් පරිගණක මිල දී ගැනීම මාස 02කින් ප්‍රමාද වී තිබුණි. | අපේක්ෂිත පරිදි කාර්යභාර්ය ඉටුවන පරිදි ප්‍රසම්පාදන සැලසුම් කළ යුතු වීම. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙහි 2021 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඇතුළත් කර වෙබ් අඩවිය යාවත්කාලීන කර නොතිබුණි. | 2021 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි ඇතුළත් කර නොතිබූ බව පිළිගනිමි. 2022 වර්ෂයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම වෙබ් අඩවියෙහි ඇතුළත් කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | වෙබ් අඩවිය නිසි පරිදි යාවත්කාලීන කළ යුතු වීම. |
| (ආ) | දෙපාර්තමේන්තුව සතු රු. 2,520,000 ක් වටිනා මෝටර් රථයක් වෙනත් ආයතන වෙත විධිමත් පැවරීමකින් තොරව භාරදී තිබුණි. | එකඟ නොවෙමි. KW 9433 මෝටර් රථය මුදල් අමාත්‍යාංශය වෙත විධිමත්ව පවරා ගැනීමේ ලේඛන මේ දක්වා මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොමැති බැවින්, එම ලේඛන ස්ථාවර වත්කම් ලේඛනයෙන් ඉවත් කිරීමට හැකියාවක් නොමැත. | වත්කම් විධිමත්ව පැවරීමට කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු සංඛ්‍යාව 102 ක් වූ අතර ඉන් තනතුරු 31 ක් පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක්ද, ද්විතික මට්ටමේ තනතුරු 17 ක්ද විය. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ මෘදුකාංග පද්ධතිය හරහා පුරප්පාඩු දැනුම් දී ඇත. එමෙන්ම කොවිඩ් - 19 වසංගතය හමුවේ නිලධාරීන් ස්ථාන මාරුවීමට දැක්වූ අකමැත්ත හේතුවෙන් පුරප්පාඩු පිරවීම අපහසු බව නිරීක්ෂණය වී ඇත. පුරප්පාඩු පැවතුණ ද පවත්නා කාර්ය මණ්ඩලය උපයෝගී කරගෙන දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමට උපරිම උත්සහා දරා ඇත. | දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ඉටු කිරීමට අවශ්‍ය පුරප්පාඩු පිරවීමත්, අවශ්‍ය නොවන කාර්යමණ්ඩලය වේනම් එය සංශෝධනය කිරීමටත් කටයුතු කළ යුතු වීම. |